**ශ්‍රී ලංකා ක්‍රිකට් ඒඩ් (ගැරන්ටි) සමාගම - 2016**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1. මතය ව්‍යාවනය**

**-------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට් ඒඩ් (ගැරන්ටි) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි සපයා ගැනීමට මා හට නොහැකි විය.

**1.2. මතය ව්‍යාවනය සඳහා පදනම**

**----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | නිදන්ගත වකුගඩු රෝග අරමුදල් රැස්කිරීමේ වැඩසටහන මඟින් එකතු කරන ලද මුළු අරමුදල් හා මුළු වියදම | 16,368,706 | මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව, ප්‍රවේශ පත්‍රවල මිල, වැඩසටහනේ පිරිවැය හා වැඩසටහනේ අපේක්ෂිත ආදායම,වැඩසටහනේ කාලසීමාව, සිද්ධි කළමනාකරණ සමාගම තෝරාගැනීමේ ක්‍රියා පටිපාටිය හා ඔවුන්ගේ කාර්යභාරය, සිද්ධි කළමනාකරණ සමාගම සඳහා ගෙවීම, අලෙවි ප්‍රවේශ පත්‍ර ගණන පිළිබඳ විස්තර, වෙන්දේසියේ තබා ඇති අයිතම | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය. | රැස් කරන ලද මුළු අරමුදල හා මුළු වියදම සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන සැපයිය යුතුය. |
| (ආ) | ආදායම හා වියදම | 5,735,000 | ලදුපත්, සවිස්තරාත්මක කාලරාමු, බැංකු තැන්පතු පත්‍රිකා, වවුචර් හා ඉනිවොයිසි | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ආදායම් හා වියදම් සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන සැපයිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මෙම සමාගම 2015 වර්ෂයේදී ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාගමේ ආදායම හා වියදම් සිදු වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,684,303 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය ශුන්‍ය විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,684,303ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2016 වර්ෂය සඳහා ආදායම රු. 17,925,000 ක් වුවද, වියදම රු. 14,240,697ක් වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.